- www.pastpapers.wiki -

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2017
විද්‍යාව
07 ශ්‍රේණිය

නම / විභාග අංකය :- ....

කාලය : පැය 02 යි

සැලකිය යුතුයි:
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i කොටස

01. ශක්තිය මනින අන්තර්ජාතික ඒකකය කුමක් ද?
(i) m (ii) J (iii) Kg (iv) w

02. සංයුක්ත පත්‍ර ඇති ශාකයකට උදාහරණයකි.
(i) පැපොල් (ii) කොහොඹ (iii) කොස් (iv) වද

03. අකුණු ඇතිවන ආකාරය පිළිබඳ ප්‍රථමවරට පරීක්ෂණ සිදුකරන ලද්දේ,
(i) විලියම් ගිල්බර්ට් විද්‍යාඥයා ය. (ii) ප්‍රැන්සිස් බේකන් විද්‍යාඥයා ය.
(iii) බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් විද්‍යාඥයා ය. (iv) ප්‍රැන්සිස්කෝ රෙඩී විද්‍යාඥයා ය.

04. රසායනික කෝෂයක් දැක්වීම සඳහා යොදන සංකේතය දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?

(i) 

(ii) 

(iii)

(iv) 

05. දෛශික රාශීන් පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(i) දුර හා විස්ථාපනය (ii) විස්ථාපනය හා බලය
(iii) දුර හා කාලය (iv) බලය හා දුර

06. පිනොප්තලින් දර්ශකය සමග රෝස පැහැයක් ලබාදෙන ද්‍රව්‍ය යුගලය කුමක් ද?
(i) දෙහි යුෂ හා විනාකිරි (ii) විනාකිරි හා සබන් දියර
(iii) සබන් දියර හා හුණු දියර (iv) හුණු දියර හා දෙහි යුෂ

07. පෘෂ්ඨවංශීන් පමණක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.
(i) මුහුදු ලිහිණියා, සමනළයා, මාළුවා (ii) කැස්බෑවා, ඉබ්බා, ගෙම්බා
(iii) ගෙම්බා, ගොළුබෙල්ලා, පසැගිල්ලා (iv) ඉබ්බා, මුහුදු ලිහිණියා, පසැගිල්ලා

08. මුදුන් මූල පද්ධතියක් දැකිය හැකි ශාකයක් වන්නේ,
(i) කුප්පමේනියා (ii) කෙසෙල් (iii) උණ (iv) කිතුල්

09. ශ්‍රී ලංකාවේ භූ කම්පනමානයක් පිහිටුවා ඇති ප්‍රදේශයක් වන්නේ,
(i) බදුල්ල (ii) පල්ලෙකැලේ (iii) ගලේවෙල (iv) ත්‍රිකුණාමලය

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

10. මෙහි දැක්වෙන සංසිද්ධිය කුමක් ද?



(i) සූර්ය ග්‍රහණය කි. (ii) චන්ද්‍ර ග්‍රහණය කි.
(iii) චන්ද්‍ර කලා ඇතිවීම. (iv) ඍතු විපර්යාසයකි.

11. ආලෝක අණ්වීක්ෂයේ උපරිම විභේදන බලය වනුයේ,
(i) 2mm ය. (ii) 0.0002mm ය. (iii) 0.002mm ය. (iv) 0.00002mm ය.

12. තිරුවානා යනු,
(i) ආග්නේය පාෂාණයකි. (ii) ඛනිජයකි.
(iii) අවසාදිත පාෂාණයකි. (iv) විපරිත පාෂාණයකි.

13. ශාක කඳක ජලය හා ඛනිජ ලවණ පරිවහනය කරන පටකය කුමක් ද?
(i) කැම්බියම් පටකය. (ii) ප්ලෝයම පටකය (iii) ශෛලම පටකය (iv) මෘදු ස්ථර පටකය

14. ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය රඳවා ඇත්තේ වායුගෝලයේ කුමන වායු ස්තරය තුළ ද?
(i) පරිවර්තීය ගෝලයේ ය. (ii) ස්තර ගෝලයේ ය.
(iii) තාප ගෝලයේ ය. (iv) මධ්‍ය ගෝලයේ ය.

15. යම් ඝන ද්‍රව්‍යයක් ද්‍රව අවස්ථාවට පත්වන නිශ්චිත උෂ්ණත්වය එම ද්‍රව්‍යයේ,
(i) තාපාංකයයි. (ii) ද්‍රවාංකයයි. (iii) තුෂාර අංකයයි (iv) හිමාංකයයි.

16. මිනිස් දේහයේ පද්ධති කිහිපයක් පිළිබඳව සිසුන් දැක් වූ අදහස් පහත දැක්වේ.
A - ආහාර ජීරණ පද්ධතියෙන් සංකීර්ණ ආහාර සරල ආහාර බවට පත්වීම.
B - ශක්තිය නිපදවීම සඳහා ඔක්සිජන් ලබාදීම ශ්වසන පද්ධතියෙන් සිදුවේ.
C - නව ජීවීන් නිර්මාණයට ජන්මාණු නිපදවීම මෛත්‍ර පද්ධතියෙන් සිදුවේ.
මින් සත්‍ය වන්නේ,
(i) A හා B පමණි (ii) A හා C පමණි (iii) A පමණි (iv) B හා C පමණි

17. පහත රූපයේ ඇති ඇටවුම යොදාගෙන ඇත්තේ ජලයේ කුමන ගුණයක් පරීක්ෂා කිරීමට ද?
(i) ජලයේ ද්‍රාවක ගුණය.
(ii) ජලයේ සිසිලනකාරක ගුණය.
(iii) ජලය ජීවයේ මාධ්‍යයක් ලෙස.
(iv) ජලයේ අද්‍රාවක ගුණය.



18. පහත දැක්වෙන කුමන ආහාරය බයියුරේට් පරීක්ෂාවෙන් රෝස දම් පැහැයක් ලබා දෙයි ද?
(i) බිත්තර සුදුමදය (ii) පාන්පිටි ද්‍රාවණය (iii) ග්ලූකෝස් ද්‍රාවණය (iv) පොල්තෙල්

19. ධ්වනිය සම්බන්ධව පහත ප්‍රකාශ සලකා බලන්න.
A - ධ්වනියේ ගමන් කිරීමට මාධ්‍යයක් අවශ්‍ය වේ.
B - ධ්වනිය වැඩි ම වේගයෙන් ගමන් කරන්නේ ද්‍රව තුළිනි.
C - 50000Hz සංඛ්‍යාතය ඇති ශබ්ද මිනිසාට ඇසේ.
මින් සත්‍ය වන්නේ,
(i) A පමණි (ii) B පමණි (iii) A හා B පමණි (iv) B හා C පමණි

20. වෛද්‍ය උෂ්ණත්වමානය සම්බන්ධයෙන් වැරදි පිළිතුර වන්නේ,
(i) එහි පරිමාණ අගය පරාසය $34^0C - 42^0C$ දක්වා වේ.
(ii) රසදිය කඳේ නැම්මක් පවතී.
(iii) මේ මගින් ජලයේ ද්‍රවාංකය මැනිය හැකි ය.
(iv) සාපේක්ෂව ප්‍රමාණයෙන් කුඩා උපකරණයකි.

(ලකුණු 20 × 2 = 40)

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

ii කොටස

- 01 වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01. A. තුන්වන වාරයේ ඇගයීම් අවස්ථාවක් ලෙස පාංශු ඛාදනය කෙරෙහි පස ආවරණය වී තිබීම බලපාන ආකාරය සොයා බැලීමට සැකසූ ඇටවුමක රූප සටහනක් පහත දැක්වේ.



පෙරී ආ ජලය

(i) ක්‍රියාකාරකමේ දී ABC බඳුන්වලට ජලය ලබාදීම සඳහා භාවිත කළ උපකරණය කුමක් ද? (ලකුණු 01)

(ii) ක්‍රියාකාරකමේ දී A හා C ඇටවුම්වල මතුපිට ස්වභාවය කෙබඳු ස්වරූපයක් ගනීද? (ලකුණු 2)

(iii) ක්‍රියාකාරකම අවසානයේ දී A හා C හිදී ලැබුණු නිරීක්ෂණ මොනවා ද? (ලකුණු 2)

(iv) ඉහත නිරීක්ෂණවලින් ඔබ ලබා ගන්නා නිගමනය කුමක් ද? (ලකුණු 1)

(v) පාංශු ඛාදනය අවම කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ගයක් ලියන්න. (ලකුණු 1)

B. ශිෂ්‍ය කණ්ඩායමක් විසින් ක්ෂේත්‍ර චාරිකාවක දී රැගෙන ආ ඛනිජ හා පාෂාණ කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් පහත හිස්තැන් පුරවන්න.

(වැලි ගල්, තිරුවානා, ග්‍රැනයිට්, කිරිගරුඬ, මිනිරන්, හුණුගල්)

(i) නිශ්චිත ජ්‍යාමිතික හැඩයක් සහිත සුදු පැහැති ද්‍රව්‍යයකි. .... (ලකුණු 01)

(ii) අවසාදිත පාෂාණයක් වන .... විපරිත වී .... සෑදේ. (ලකුණු 02)

(iii) .... ඛනිජය පැන්සල් නිෂ්පාදනයේ දී යොදා ගනී. (ලකුණු 01)

(iv) ලාවා සිසිල් වීමෙන් හට ගන්නා ආග්නේය පාෂාණයකි. .... (ලකුණු 01)

(v) දැඩි බවක් නොදක්වන අවසාදිත පාෂාණයකි. .... (ලකුණු 01)

C. පහත රූපයේ දැක්වෙන්නේ සෑන් ඇන්ඩ්‍රියාස් විභේදනයයි.

(i) මෙහි දෙපස පිහිටි භූ තැටි දෙක නම් කරන්න. (ලකුණු 01)

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

(ii) පෘථිවියේ ඇතුළත ස්වභාවය දක්වන රූප සටහනක් පහත දැක්වේ.



(a) මෙහි B ස්ථරයේ පවතින ද්‍රව්‍ය කුමන භෞතික අවස්ථාවේ පවතී ද? (ලකුණු 01)

(b) A හි බහුලව පවතින මූල ද්‍රව්‍යයක් නම් කරන්න. (ලකුණු 01)

02. A. අප ගන්නා සමබල ආහාරයේ විවිධ පෝෂණ වර්ග අඩංගු ය. එම පෝෂක කිහිපයක් පහත පරිදි සඳහන් කර ඇත.



(i) මෙහි සඳහන් කර නොමැති පෝෂක කණ්ඩය ලියන්න. (ලකුණු 01)
(ii) ප්‍රෝටීන බහුලව අඩංගු සත්වමය ආහාර වර්ග 2ක් දක්වන්න. (ලකුණු 02)
(iii) කාබෝහයිඩ්‍රේට් කාණ්ඩ 2 නම් කරන්න. (ලකුණු 01)
(iv) ඛනිජ ලවණ ඇසුරින් පහත වගුව පිටපත් කරගෙන පුරවන්න. (ලකුණු 03)

ඛනිජ ලවණය	ඉටුවන කාර්යය
කැල්සියම්	a.
යකඩ	b.
අයඩින්	c.

(v) ආහාරයට තන්තුමය කොටස් එක්වීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න. (ලකුණු 01)

B. යම් ද්‍රව්‍යයක උණුසුම හෝ සිසිල පිළිබඳ මිනුම් උෂ්ණත්වය ලෙස හඳුන්වයි.
(i) උෂ්ණත්වමානයක භාවිත වන ද්‍රව වර්ග 2නම් කරන්න. (ලකුණු 01)
(ii) උෂ්ණත්වමානය මගින් උෂ්ණත්වය මැනීමේ දී සැලකිය යුතු කරුණු 1ක් ලියන්න. (ලකුණු 01)
(iii) මිනිස් සිරුරේ උෂ්ණත්වය 37^0C නම් එම අගය කෙල්වින් කීය ද? (ලකුණු 01)

03. A.
(i) පහත දක්වා ඇති සංයුක්ත අන්වීක්ෂයේ ABC කොටස් නම් කරන්න. (ලකුණු 03)



- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

(ii) මෙහි උපනෙතේ විශාලනය 10× ද, අවනෙතෙහි විශාලනය 40× ද වේ නම්, අන්වීක්ෂයේ විශාලනය සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න. (ලකුණු 01)

(iii) විද්‍යාගාරයේ දී ඇණු සිවියක සෛල ඉහත අන්වීක්ෂයකින් පෙනෙන අයුරු ඇඳ දක්වන්න. (ලකුණු 02)

(iv) A හා C සඳහා යොදා ඇති කාච වර්ගය කුමක් ද? (ලකුණු 01)

(v) ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය භාවිත වන අවස්ථාවක් ලියන්න. (ලකුණු 01)

B.



රූපයේ දැක්වෙන පරිදි ඝණ්ඨාසරාව තුළ විදුලි සීනුවක් සවිකර එය නාදවීමට සලස්වා ඇත. ඝණ්ඨාසරාව තුළ ඇති වාතය රික්ත පොම්පය මගින් ක්‍රමයෙන් ඉවත් කරනු ලැබේ.

(i) රික්ත පොම්පය ක්‍රියා කරවීමෙන් පසුව ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(ii) ධ්වනි සම්ප්‍රේෂණය යනු කුමක් ද? (ලකුණු 01)

(iii) ගංවතුරට පහත් බිම් යට වී ඇති අවස්ථාවල දී ඒ අසල මහා මාර්ගවල ගමන් කිරීමේ දී වාහනවල ශබ්දය වෙනදාට වඩා වැඩියෙන් ඇසේ. එයට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 01)

04. A. පරිපථවල අඩංගු උපාංගයක බාහිර පෙනුම මෙම රූප සටහනින් දැක්වේ.



(i) මෙහි දක්වා ඇති උපාංගය කුමක් ද? (ලකුණු 01)

(ii) එයට අදාළ සම්මත සංකේතය අඳින්න. (ලකුණු 01)

(iii) මෙම උපාංගයේ ධාරිතාවය ප්‍රකාශ කරන ඒකකය කුමක් ද? (ලකුණු 01)

(iv) විද්‍යාගාරයේ දී සරල ධාරිත්‍රයක් නිර්මාණයට ඔබ යොදාගත් ද්‍රව්‍ය යුගලය ලියන්න. (ලකුණු 01)

(v) ඔබ සාදාගත් ධාරිත්‍රකයට විදුලි ධාරාවක් යවා එය ආරෝපණය වී දැයි හඳුනාගන්නේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 01)

B. (i) පහත රූප සටහන් නිරීක්ෂණය කර, ඒවා සරල ධාරා නිපදවන හා ප්‍රත්‍යාවර්ත ධාරා නිපදවන උපාංග ලෙස වෙන්කර දක්වන්න. (ලකුණු 02)

a

b



(ii) සරල ධාරාව, කාලයක් සමඟ ප්‍රස්ථාර ගත කළ විට ලැබෙන ප්‍රස්ථාරය දළ වශයෙන් ඇද දක්වන්න. (ලකුණු 01)

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

C. (i) පහත සඳහන් වගුවෙහි හිස්තැන් නිවැරදිව සම්පූර්ණ කරන්න.

දර්ශකය	අම්ල සමඟ ලබාදෙන වර්ණය	භෂ්ම සමඟ ලබාදෙන වර්ණය
නිල් ලිට්මස්	(1)	වර්ණ වෙනස් නොවේ.
pH කඩදාසි	රතු	(3) ....
මෙතිල් ඔරේන්ජ්	(2)	කහ

(ලකුණු 03)

05. A. (i) ආලෝකයේ පරාවර්තනය එදිනෙදා කටයුතු වල දී ප්‍රයෝජනයට ගනී. මෙහි a හා b නම් කරන්න. (ලකුණු 01)



(ii) තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්බයක ලක්ෂණ 2 ලියන්න. (ලකුණු 02)

(iii) පහත ඉංග්‍රීසි අක්ෂරය තල දර්පනයෙන් පෙනෙන ආකාරය අඳින්න. (ලකුණු 01)

(iv) තල දර්පණ 2ක් ආනතව තැබීමෙන් ලබාගන්නා බහු ප්‍රතිබිම්බ එදිනෙදා ජීවන කටයුතුවල දී භාවිතා කරන අවස්ථා 2ක් ලියන්න. (ලකුණු 02)

(v) අවතල දර්පණ හා උත්තල දර්පණ භාවිත වන අවස්ථා 1 බැගින් දක්වන්න. (ලකුණු 02)

B. පහත දී ඇති ශක්ති ප්‍රභව පුනර්ජනනීය හා පුනර්ජනනීය නොවන ලෙස වර්ග කර වගුවක දක්වන්න.

(ඛනිජ තෙල්, භූතාපය, ස්වාභාවික වායු, සූර්යය ශක්තිය, න්‍යෂ්ටික ශක්තිය, සුළගේ ශක්තිය)

$(\frac{1}{2} \times 6 = 3)$

06. තාපය යනු ශක්ති ප්‍රභේදයකි.

A. (i) "තාප සංක්‍රමණය" යනු කුමක්දැයි හඳුන්වන්න.

තාප සංක්‍රමණ ක්‍රමයක් ආදර්ශනයට සැකසූ ඇටවුමක රූපයක් පහත දැක්වේ.



- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

(ii) මෙහිදී සොයා බැලූ තාප සංක්‍රමණ ක්‍රමය කුමක් ද? (ලකුණු 01)
(iii) ඉහත දාහකයට අත ළං කළ විට අතට උණුසුමක් දැනෙන්නේ ඇයි? (ලකුණු 01)
(iv) තාප ශක්තිය නිසා හටගන්නා ස්වාභාවික සංසිද්ධි 2ක් රූපසටහනකින් දැක්වේ.



A



B

(a) ඉහත A හි දක්වන සංසිද්ධිය නම් කරන්න. (ලකුණු 01)
(b) B රූපයේ ඇතිවන සංසිද්ධිය ධීවරයින් ප්‍රයෝජනයට ගන්නේ කුමක් සඳහා ද? (ලකුණු 01)
(v) ක්‍රිකට් ක්‍රීඩකයින් දිවා කාලයේ පවත්වන තරගවල දී සුදු පැහැති ඇඳුම් ඇඳීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

B. (i) "බලයක්" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 01)
(ii) පහත අවස්ථාවල දී යොදන බලය කුමක්දැයි සඳහන් කරන්න.
(a) ළිඳකින් වතුර ඇදීමේ දී
(b) බයිසිකල් පැදීමේ දී (ලකුණු 02)
(iii) බලයක් මගින් වස්තුවක ඇති කල හැකි වෙනස්කම් 2ක් හා ඊට උදාහරණ වගුවේ දක්වන්න.

බලය මගින් ඇතිකරන වෙනස්කම	අවස්ථාව/ උදාහරණය

$(\frac{1}{2} \times 4 = 2)$

07. A. පහත සඳහන් ප්‍රකාශය නිවැරදි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.
(i) තෙල් එඩරු බීජ ජෛව ස්කන්ධ ලෙස යොදා ගනී. ( )
(ii) වස්තුවක් තුළ ගබඩාවන ශක්තිය විභව ශක්තියයි. ( )
(iii) රිකට්ස් අයඩින් ඌනතාව නිසා වැළදේ. ( )
(iv) පුෂ්පයක ජායාංගය මගින් පරාග නිපදවයි. ( )
(v) අනාකූල හැඩය මත්සයින්ට සංචරනයට උපකාරී වේ. ( )
(vi) දෙමුහුම් වාහන හා විදුලි භාවිතය ශක්ති ප්‍රභව වල තිරසර භාවිතයට උදව් වේ. ( )
(ලකුණු 1 × 6)

B. A තීරුවේ ඇති වගන්ති කියවා එයට ගැළපෙන නිවැරදි පිළිතුරු වල අක්ෂර B තීරුවෙන් තෝරා හිස්තැන් මත ලියන්න.

	A		B
(i)	පස් කැටයක් ජල භාජනයකට දැමූ විට බුබුළු ලෙස පිටවන්නේ	( )	(a) පාංශු ජලය
(ii)	වැලි පස තුළ නොරැඳෙන්නේ	( )	(b) මව් පාෂාණ
(iii)	බොහෝ විට ශාක මුල් විහිදී ඇත්තේ	( )	(c) පාංශු වාතය
(iv)	පාංශු පැතිකඩෙහි පතුලෙහිම පවතින්නේ	( )	(d) පාංශු ඛාදනය
(v)	මුහුදු රළ මගින් වෙරළ මුහුදට සේදී යාම	( )	(e) මතුපිට පස

(ලකුණු 1 × 6)

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

බස්නාහිර පළාත්
අවසාන වාර ඇගයීම් පරීක්ෂණය - 2017
පිළිතුරු

i කොටස

01. (ii)	06. (iii)	11. (ii)	16. (i)
02. (ii)	07. (ii)	12. (ii)	17. (ii)
03. (iii)	08. (i)	13. (iii)	18. (i)
04. (ii)	09. (ii)	14. (iii)	19. (i)
05. (ii)	10. (ii)	15. (ii)	20. (iii)

ii පත්‍රය

01. A. (i) ජල කරාමය/ සිදුරු සහිත ටින් බඳුනක්

(ii) A. තණකොළ සිටුවා ඇත. (වැස්මක් සහිත)

C. පසි විවෘතව ඇත. (වැස්මක් නොමැත)

(iii) A. තණකොළ සිටවූ පස් සහිත බෝතලයෙන් වැගිරෙන ජලයේ බොරපාට ඉතා අඩු ය.

C. විවෘත පස් සහිත බෝතලයෙන් වැගිරෙන ජලයේ බොරපාට වැඩිය.

(iv) පසට ආවරණයක් යෙදූවිට පාංශු ඛාදනය අඩුවන බව

(v) සමෝච්ඡ කාණු කැපීම.

බෑවුමට හරස්ව ගල්වැටි බැඳීම.

මූල පද්ධතිය හොඳින් විහිදී යන ආවරණ වගාවක් යෙදීම වැනි එකක්.

B. (i) තිරුවානා

(ii) හුණුගල්, කිරිගරුඬ

(iii) මිනිරන්

(iv) ග්‍රැනයිට්

(v) වැලිගල්

C. (i) උතුරු ඇමරිකා/ පැසිපික් හුනැටි

(ii) (a) B ද්‍රව අවස්ථාවේ පවතී.

(b) යකඩ/ නිකල්

02. A. (i) විටමින්

(ii) මස්, මාළු, කරවල, බිත්තර

(iii) පිෂ්ඨය, සීනි

(iv) කැල්සියම් - තුවාලයක රුධිරය කැටි ගැසීම, දත් අස්ථි නිරෝගීව තබා ගැනීමට.

යකඩ - ක්‍රියාශීලී බව පවත්වාගෙන යාම, හිමොග්ලොබින් වර්ණකය නිපදවීම.

අයඩින් - බුද්ධිය හා මතක හැකියා වර්ධනය කිරීම, තයිරොක්සීන් හෝර්මෝනය නිපදවීම.

(v) ආහාරවල අඩංගු මේදමය සංඝටක ශරීරයට අවශෝෂණය කිරීම අඩු කිරීම.

ආහාරවල අඩංගු සීනි ශරීරයට අවශෝෂණය කර ගැනීම අඩු කිරීම.

මල බද්ධය වළක්වා අර්ශස් වැනි රෝග වැළැදීමේ ප්‍රවණතාවය අඩු කිරීම.

B. (i) රසදිය, මධ්‍යසාර

(ii) පාඨාංක ලබා ගැනීමේදී ඉහළ කෙළවර ඇස් මට්ටමේ තබාගෙන බැලීමට පහසුවනසේ උෂ්ණත්වමානය සකසා ගත යුතුය.

උෂ්ණත්වමානයේ බල්බය උෂ්ණත්වය මැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සමඟ හොඳින් ස්පර්ශ වන සේ තබා ගැනීම.

(iii) 310k

- www.pastpapers.wiki -

03. A. (i) A. අවනෙත
B. දර්පණය
C. උපනෙත
(ii) 10 × 40 = 400 (විශාලනය = අවනෙතේ විශාලනය × උපනෙතේ විශාලනය)
(iii)



(iv) උත්තල කාච
(v) ජාන විද්‍යාත්මක පර්යේෂණ කටයුතු සඳහා සෛලගත අභ්‍යන්තර ව්‍යුහය සවිස්තරාත්මකව අධ්‍යයනයට
විවිධ රෝග කාරක ජීවීන් පර්යේෂණයයට

B. (i) වාතය ඇති විට හඬ ඇසුනද ක්‍රමයෙන් වාතය ඉවත් වන විට හඬ නොඇසේ.
(ii) ධ්වනි ප්‍රකවයකින් හටගන්නා ධ්වනිය හෙවත් ශබ්දය හට ගන්නා ස්ථානයෙන් ඈතකට පැතිරී යාම.
(iii) වාතයට වඩා වැඩි වේගයකින් ද්‍රව තුළින් ධ්වනිය ගමන් කිරීම.

04. A. (i) ධාරිත්‍රකය+ -
(ii)
(iii) ෆැරඩ්
(iv) තුනී ඇලුමිනියම් තහඩු, කඩදාසි තීරු, පොලිතීන් තීරු
(v) ගැල්වනෝමීටරය සම්බන්ධ කිරීමෙනි.

B. (i) a. ප්‍රත්‍යාවර්ත ධාරා නිපදවන
b. සරල ධාරා නිපදවන
(ii) 

C. (i) a. රතු b. නිල්, කොළ, දම් c. රතු

05. A. (i) A. පතන ආලෝකය/කිරණය
B. පරාවර්තන ආලෝකය/ කිරණය
(ii) වස්තු දුර ප්‍රතිබිම්බ දුරට සමානය
ප්‍රතිබිම්බය උඩුකුරුය
අතාත්විකය
වස්තුවේ ප්‍රමාණයට සමානය
පාර්ශ්වික අපවර්තනය සිදු වේ
(iii)

(iv) රෙදිපිළි මෝස්තර සඳහා/ විවිධ වෙළඳසැල්වල
පිඟන් ගඩොල්වල මෝස්තර නිරූපණයට

(v) අවතල දර්පණ - රැවුල කැපීමේදී, සූර්ය උඳුන්, දන්ත වෛද්‍යවරු
උත්තල දර්පණ - වාහන පැති කණ්ණාඩි

B.

පුනර්ජනනීය	පුනර්ජනනීය නොවන
භූතාපය	ඛනිජ තෙල්
සූර්ය ශක්තිය	ස්වාභාවික වායු
සුළං ශක්තිය	න්‍යෂ්ටික ශක්තිය

06. A. (i) තාපය එක් තැනක සිට තවත් තැනකට ගමන් කිරීමයි.

(ii) සංවහනය

(iii) තාපය විකිරණයක් මගින් සංක්‍රමණය වීමෙනි.
තාපය විකිරණය වීමෙනි.

(iv) (a) මුහුදු සුළං ඇති වීමෙනි.
(b) මුහුදු යාම සඳහා

(v) සුදු ඇඳුම් - විකිරණය මගින් තාපය අවශෝෂණය කිරීම අඩු නිසා හෝ පරාවර්තනය කිරීම.

B. (i) ඇදීමක් හෝ තල්ලු කිරීමක්

(ii) (a) ඇදීම
(b) තල්ලු කිරීම

(iii)

බලයෙන් ඇතිකරන වෙනස්කම්	අවස්ථාව
1. නිශ්චල වස්තුවක් චලනය කළ හැක.	දුන්නකින් විදීම.
2. චලනය වන වස්තුවක් නිශ්චල කළ හැක.	බෝලයක් ඇල්ලීම.
3. චලනය වන වස්තුවක වේගය වෙනස් කළ හැක.	බයිසිකලයක් වේගයෙන් පැදීම.
4. වස්තුවක චලිත දිශාව වෙනස් කළ හැක.	බෝලයකට පහරක් දීම.

07. A.

(i) ✓ (ii) ✓ (iii) × (iv) × (v) ✓ (vi) ✓

B.

(i) c (ii) a (iii) e (iv) b (v) d